ශීර්ෂය 288 මිනින්දෝරු දෙපාර්තමේන්තුව
-----------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 22 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

දෙපාර්තමේන්තුව අදාළ දේපළ පිරියත හා උපකරණ ගිණුම් ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මැනුම් උපකරණ මිලදී ගැනීම සඳහා වූ රු.66,000,000 ක්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් තුළ ඇතුළත්ව තිබුණු නමුත්, 2022 අප්‍රේල් 25 දින වන විට ණයවර ලිපි විවෘත කිරීම පමණක් සිදුකර තිබුණු අතර, භාණ්ඩ තොගය ලැබී නොතිබුණි. අදාළ මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | රුපියල් 66,000,000 ක් වටිනා GNSS රිසීවර්ස් 8C මැනුම් උපකරණ කට්ටල 30 ක් මිලදී ගැනීම් යටතේ ඇතුළත්ව තිබුණු නමුත් 2022 ජනවාරි 03 දින ජ'නල් සටහන් මගින්, ස්ථාවර වත්කම් ශේෂයෙන් ඉවත් කර ඇත. රටේ පවතින අර්බුදය මත ලංකා බැංකුව විසින් අදියර පහක් යටතේ ගෙවීමේ පදනම මත ණයවර ලිපි පහක් විවෘත කිරීමට කටයුතු කර ඇති නමුත් භාණ්ඩවලින් කොටසක් රැගෙන අදාළ නෞකාව ශ්‍රී ලංකාව වෙත ළඟා වුවද පොරොන්දු වූ පරිදි ගෙවීම් කිරීම ප්‍රමාද වීම නිසා නැවත ගොස් ඇත. ඇණවුම ඉදිරිපත් කරන අවස්ථාවේ තිබූ ඩොලරයේ වටිනාකම ඉහළ ගොස් ඇති බැවින් එම වෙනස අදාළ සමාගමට ගෙවන්නේ නම් පමණක් භාණ්ඩ සැපයිය හැකි බව දන්වා ඇත. එසේ ගෙවීමේ හැකියාව පිළිබඳව භාණ්ඩාගාර ලේකම්ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර, දැනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති මුදල භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් පරිදි ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත. | මිලදී ගැනීම් තුළ ඇතුළත්ව ඇති මැනුම් උපකරණ ලැබී නොමැති බැවින් ඒවා ඉවත් කිරීමටත්, දැනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති මුදල භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් පරිදි ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 සීමා ඉක්මවීම්

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ඉක්මවීම් පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විෂයාංක 28801 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ විසර්ජන පනත අනුව අවම ලැබීම් සීමාව රු. 134,000,000 ක් වුවද, සත්‍ය ලැබීම් රු.129,849,423 ක් වූයෙන් අවම ලැබීම් සීමාව රු.128,000,000 ලෙස සංශෝධනය කිරීමට 2021 දෙසැම්බර් 31 දින ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් මගින් මුදල් අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් යොමුකර තිබුණු නමුත්, ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය මෙම වාර්තාවේ දිනය වන තෙක් ලැබී නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. මේ වන තෙක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී නොමැත. | අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 අගෝස්තු 04 දිනැති සර්වේයර් ජනරාල්ගේ අංක 6/2021 දරන ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛයේ 2 ඡේදය | හෝමාගම ප්‍රාදේශීය කාර්යාලයේ සිටින රජයේ මිනින්දෝරුවරුන් අතර ස්වාමි පුරුෂයා හා භාර්යාව වශයෙන් රාජකාරී සිදු කරන පවුල් දෙකක් අතරින් කාර්යාල පවත්වාගෙන යන බව සඳහන් කර තිබුණු එකම ස්ථානය සඳහා දෙදෙනාටම මසකට රු. 7,800 බැගින්ද, නිවාසය බව සඳහන් ස්ථානය සඳහා අනෙක් දෙදෙනාටම එක් අයෙකුට රු. 7,800 බැගින්ද, වෙන වෙනම මාසිකව කාර්යාල කුලී දීමනාව ලබා දී තිබුණි. | රු.7,800 කට නිවසක් කුලියට ගැනීමේ හැකියාවක් නැත. භාර්යාව හා ස්වාමිපුරුෂයා වුවද වෙන වෙනම කාර්යාල කුලී හිමිකම ඇත. නිත්‍ය නියෝග පළමු පරිච්ඡේදයේ 1.40 අනුව කොටස් වශයෙන් ලැගුම් දීමනා සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අවසරය ලබා දී ඇත. | ස්වාමි පුරුෂයා හා භාර්යාව වශයෙන් එකම ස්ථානයක රාජකාරි සිදු කිරීමට හැකියාව පවතින බැවින් වෙන වෙනම මාසික කාර්යාල කුලී දීමනාව ලබා දීම පිළිබඳව නැවත සමාලෝචනය කළ යුතුව ඇත. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

----------------------

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ හෝමාගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ වාහනවල අභ්‍යන්තර හා බාහිර අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,292,556 ක මුදලක් වැය කර තිබුණු අතර, ඒ පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව බාහිර අලුත්වැඩියාවන් සඳහා ටෙන්ඩර් හෝ මිල ගණන් කැඳවා නොතිබුණු අතර, අභ්‍යන්තර අලුත්වැඩියාවන් සඳහා වාහනය කොටස්වලට ගැලවූ ගරාජයේ මිළගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවකුගෙන් වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. එහි 4.4 වගන්තිය අනුව අදාළ පළාතේ ප්‍රධාන නගරයේ පිහිටි වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් ප්‍රවීණත්වයක් උසුලන ගරාජයන් තෝරා ගැනීම වෙනුවට මෙම වාහන සඳහා නගර සීමාවෙන් පිට පුද්ගලික ගරාජයක් තෝරාගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 පරිදි අලුත්වැඩියාවන් සඳහා ගරාජයන් ලියාපදිංචි කිරීමක්ද සිදු කර නොතිබුණි. | (අ), (ආ), (ඇ), (ඈ) සඳහා අදාළ වේ.<br>හෝමාගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ වාහන අලුත්වැඩියා සම්බන්ධව ඉදිරිපත් කරන ලද කරුණු සඳහා අදාළ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගෙන් පිළිතුරු කැඳවා තිබුණු අතර එම පිළිතුරු සියල්ල සඳහා එකඟවිය නොහැකි බැවින් යම් අක්‍රමිකතාවයක් සිදුව තිබේ නම් ඒවා හඳුනාගෙන අදාළ නිලධාරියාට විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරමි.<br>විගණන වාර්තාව හා අදාළ ලේඛන පදනම් කර කඩිනම් පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් කැඳවන ලද නමුත් ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ නිර්දේශය මත ආයතන සංග්‍රහයේ 48 පරිච්ඡේදයේ 29-3 | පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) | අංක WPLE – 3670 දරන වාහනය පරීක්ෂා කර බලා ප්‍රවාහන නිලධාරි විසින් නොවැම්බර් 17 දින දිරූම් සහ මලකෑ ස්ථාන පමණක් ටිංකර් සහ පින්තාරු කිරීමට නිර්දේශ කර තිබුණු නමුත්, එය සිදු කර නොතිබුණි. ඒ වෙනුවට හෝමාගම ප්‍රාදේශීය කාර්යාලයේ මිනින්දෝරු අධිකාරි විසින් පාදුක්ක ප්‍රදේශයේ ගරාජ තුනකින් දින රහිත මිල ගණන් ලබා ගෙන 2021 දෙසැම්බර් 1 දින රු.280,000 කට එයින් එක් පුද්ගලික ගරාජයකින් සත්‍ය වශයෙන්ම අලුත්වැඩියාව සිදු කළ බවට මිනින්දෝරු අධිකාරි හා රියදුරු විසින් සහතික කරමින්, | වගන්තිය අනුව මූලික විමර්ශණයක් සිදු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරයෙකුගේ සභාපතීත්වයෙන් යුතු මූලික විමර්ශණ මණ්ඩලයක් පත් කරන ලදි. එම මූලික විමර්ශණ වාර්තාව පදනම් කරගෙන අදාළ විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි යම් අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් එම නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඉදිරියේදී ඔබ වෙත දන්වා | පරීක්ෂණයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එදිනම සකසන ලද වවුචර්පත, කොළඹ දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමුකර තිබුණි. මීට අමතරව බිල්පතෙහි සඳහන් ලිපිනයෙහි එවැනි ගරාජයක් පිහිටා නොතිබුණු බවද ස්ථානීය පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. විගණන නිරීක්ෂණය නිසා එම ගෙවීම සිදු කර නොතිබුණි. | එවන බව වාර්තා කරමි. | |
| (ඇ) | ඉහත (ආ) හි සඳහන් පුද්ගලික ගරාජයෙන් රු. 88,500 ක් ගෙවා අංක 250 – 4728 දරන වාහනයේ අලුත්වැඩියා 2021 දෙසැම්බර් 28 දින සිදුකළ බව දක්වමින් එදිනම කොළඹ දිස්ත්‍රික් කාර්යාලය වෙත බිල්පත ගෙනවිත් භාර දී, ඒ සඳහා ගෙවීම්ද කර තිබුණි. එම වවුචරය හෝමාගම ප්‍රාදේශීය මිනින්දෝරු අධිකාරි සහ වාහනයේ රියදුරු විසින් නිර්දේශ කර තිබුණු බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 135 අනුව එක් එක් ගනුදෙනුව නිලධාරීන් කිහිප දෙනෙකු මාර්ගයෙන් අධීක්ෂණයට භාජනය වන ආකාරයට වැඩ බෙදීමක් කළ යුතු නමුත්, මෙම අලුත්වැඩියාවන් සඳහා අනුමත කිරීම , මිළගණන් කැඳවීම, ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස කටයුතු කිරීම හා ගෙවීම් සඳහා නිර්දේශය දීම යන සියලුම කටයුතු කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සිදු කර තිබුණි. | | මු.රෙ.135 අනුව එක් එක් ගනුදෙනුව නිලධාරීන් කිහිප දෙනෙකුගේ අධීක්ෂණයට ලක් වන ආකාරයට වැඩ බෙදීමට කටයුතු කළ යුතුය. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 දැක්ම හා මෙහෙවර**

`

-----------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| “ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා” වන දැක්ම පෙරදැරි කර ගෙන “වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් | මිනින්දෝරුවරයෙකු මාසයකදී සිදුකළ යුතු අවම වැඩ ප්‍රමාණයන් 2007 සර්වේයර් ජනරාල්ගේ ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ | නවීන මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග සමාලෝචනය කරමින්, දෙපාර්තමේන්තුවේ දැක්ම |

| | | |
|---|---|---|
| සැපයීම" මෙහෙවර කර ගත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර, මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20ක් වන අතර ඉඩම් කැබලි නම් 30 කි. අනෙකුත් මැනුම් සඳහා ඉඩමේ හෙක්ටයාර් ප්‍රමාණය 30 ක් හා මනින ලද දුර කි.මී.5 ක් ලෙස ප්‍රගතිය ගණනය කරනු ලැබේ. වර්ෂ 15 කටත් පෙර පිහිටුවාගත් මෙම සම්මත, මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග සමාලෝචනය කර, දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර පරිදි ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම යාවත්කාලීන වී නොතිබුණු නමුත්, 2018 සිට 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම යටතේ නවීන මැනුම් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 430 ඉක්ම වූ මුදලක් වැය කර තිබුණි. | අංක 06/2007 මගින් සංශෝධනය කර ඇත. මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත හේතූන් මත සිදු කරන මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20ක් වන අතර ඉඩම් කැබලි නම් 30 කි. අනෙකුත් මැනුම් සඳහා ඉඩමේ හෙක්ටයාර් ප්‍රමාණය අනුව හා මනින ලද කි.මී. ගණන අනුව ප්‍රගතිය ගණනය කරනු ලැබේ. සර්වේයර් ජනරාල්ගේ ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ 2015 අංක 3/2015 හා 2021 අංක 02/2021 මගින් සිදු කළයුතු මාසික වැඩ ප්‍රමාණය සංශෝධනය කරන ලද නමුත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් මගින් ප්‍රගතිය ලබා දීමේ ඇති ගැටලු පෙන්වාදීම මත ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් එම චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම නවතන ලදි. | හා මෙහෙවර අනුව ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවක් සැපයීම සඳහා, වර්ෂ 15 කටත් පෙර පිහිටුවාගත් මෙම සම්මත යාවත්කාලීන කළ යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට තිබුණු මැනුම් නියෝග සංඛ්‍යාව 31,020 ක් වූ අතර, ඒ තුළ 2015 වර්ෂයට පෙර සිට මේ දක්වා නිම කිරීමට නොහැකි වී තිබුණු මැනුම් නියෝග 15,097 ක්ද, මැනීම සඳහා භාර දී නොමැති මැනුම් ඉල්ලීම් 15,923 ක්ද විය. | 2021 දෙසැම්බර් 31 දිනට මැනුම් ඉල්ලීම් 31,020 ක් නිම කිරීමට නොහැකිව පැවතුණ අතර මෙම ඉල්ලීම්වලින් දැනට කටයුතු කිරීමට අනවශ්‍ය ඉල්ලීම් ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාකච්ඡා කර දත්ත පද්ධතියෙන් ඉවත් කරන ලෙස ක්ෂේත්‍රය දැනුවත් කර ඇත. මැනුම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යෝජනා මාලාවක් ද ඉදිරිපත් කර ඇත. | හිඟ හිටව ඇති මැනුම් නියෝග කාලීනව ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙහි බිම්මහලෙහි කොටසක කොළඹ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීම සඳහා 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබියදී කොවිඩ් තත්ත්වය මත ඉතිරිව තිබුණු ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා වූ ප්‍රතිපාදනවලින් 2020 වර්ෂයේදී රු.4,458,893ක් හා 2021 වර්ෂයේදී රු.1,614,297ක්ද වශයෙන් එකතුව රු. 6,073,190 ක් මේ සඳහා වැය කර තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 ඡේදය ප්‍රකාරව රුපියල් මිලියන 2 නොඉක්මවන ඉදිකිරීම් වැඩ සඳහා වූ කොන්ත්‍රාත් පමණක් ප්‍රජා සංවර්ධන සමිති සඳහා ලබාදිය හැකි බැවින්, එක කොන්ත්‍රාත්තුවක් ලෙස කටයුතු නොකර, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි, තිඹිරිගස්යාය ප්‍රදේශයේ පිහිටි ප්‍රජා සංවර්ධන සමිති 05 කින් කොන්ත්‍රාත් 07 ක් ලෙස මිල ගණන් කැඳවා අඩු මිල ඉදිරිපත් කරන ලද එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත කොන්ත්‍රාත් 07 ක් ලෙස කොටස්වලට කඩා රු. 6,073,190 ක් වූ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හා කාර්යාලය නියමිත දිනට ආරම්භ කිරීමට අවශ්‍යතාවයක් වූ නිසා එකම කාල රාමුවක් තුළ සියල්ල අවසන් කර ගැනීම සඳහා ගොඩනැගිලි අංශය, බස්නාහිර පළාත් කාර්යාලය හා කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට ප්‍රසම්පාදන කළ යුතු කොටස් වෙන්කර ලබා දී අලුත්වැඩියා කටයුතු සිදුකර ඇත. එහිදී ප්‍රධාන කාර්යාලයෙන්, පළාත් කාර්යාලයෙන් හා දිස්ත්‍රික් කාර්යාලයෙන් විවිධ කොටස් සඳහා මිල ගණන් කැඳවා ඇත. ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවල දී කොටස් වශයෙන් ප්‍රසම්පාදන කටයුතු නොකිරීමට කටයුතු කරනු ඇත. එමෙන්ම මිල ගණන් කැඳවීමේ දී අඩු මිල ඉදිරිපත් කරන ලද සමිතිය වෙත තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිල ගණන් කැඳවීමේ සිට කොන්ත්‍රාත් කටයුතු ඉටු කිරීම දක්වා විනිවිද භාවයෙන් යුතුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන අත් පොතේ 3.9.1 ඡේදය ප්‍රකාරව එම සමිතිවල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ කොන්දේසි සහ නීත්‍යානුකූලභාවය හා හැකියාව තහවුරු කිරීම සඳහා වූ කොන්දේසි පිළිබඳව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු කළ යුතු වූ නමුත්, මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් එම කරුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | මෙම ඉදි කිරීම සඳහා මිල ගණන් කැඳවීම හා සැපයුම්කරුවන් තෝරා ගැනීම සිදු කරනු ලැබුවේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වූ ප්‍රජා සංවර්ධන සමිති හා ICTAD ලියාපදිංචි ආයතන ද ඇතුළත් වූ සැපයුම්කරුවන්ගේ ලේඛනයකට අනුවය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 අනුව ඇගයීමක් සිදු නොකර තාක්ෂණික ඇගයීම් කමිටුවක් හරහා ඇගයීම් සිදු කර ක්‍රොන්ත්‍රාත් පිරිනැමීම සිදු කර ඇති බව පෙන්වා දෙමි. | ප්‍රසම්පාදන අත් පොතේ 3.9.1 ඡේදය ප්‍රකාරව අදාළ සමිතිවල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ සහ නීත්‍යානුකූලභාවය හා හැකියාව තහවුරු කිරීම සඳහා වූ කොන්දේසි පිළිබඳව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු කළ යුතුව ඇත. |
| (ඇ) | මු.රෙ. 135 අනුව එක් එක් ගනුදෙනුව නිලධාරීන් කිහිප දෙනෙකු මාර්ගයෙන් පරීක්ෂණයකට භාජනය වන ආකාරයට රාජකාරී බෙදා නියම කළ යුතු නමුත්, මෙම ඉදිකිරීමෙහි ඇස්තමේන්තු පිළියෙල කිරීම, මිල ගණන් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය කිරීම, වැඩ අවසන් කළ පසු අවසන් බිල්පත පරීක්ෂා කර මුදල් ගෙවීම සඳහා නිර්දේශ කිරීම හා වැඩ අවසන් බවට වාර්තාව ලබාදීම යන සියලු කටයුතු තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී විසින් සිදු කර තිබුණි. | ගොඩනැගිලි අළුත්වැඩියා සහ නව ඉදිකිරීම්වල ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් නම්කර එවා ඇති තාක්‍ෂණ නිලධාරීගේ සහය ලබාගෙන ඇත. එම තාක්ෂණික නිලධාරී විසින් ඇස්තමේන්තු පිළියෙල කරන ලද අතර ප්‍රසම්පාදන කටයුතුවලදී උපරිම අයුරින් රහස්‍යභාවය පවත්වා ගැනීමට කටයුතු කර ඇත.<br>මේ වනවිට ගොඩනැගිලි අංශයට නව ගොඩනැගිලි පරීක්ෂක නිලධාරිනියක් පත්ව ඇති බැවින් ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයෙන් සහ රහස්‍යභාවය උපරිම අයුරින් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත . | මු.රෙ. 135 අනුව එක් එක් ගනුදෙනුව නිලධාරීන් කිහිප දෙනෙකුගේ අධීක්ෂණයට ලක් වන ආකාරයට වැඩ බෙදීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වායු සමීකරණ යන්ත්‍ර වෙනුවෙන් රු.590,400 ක්ද, සිවිලින් විදුලි පංකා 12 ක් වෙනුවෙන් රු.134,400 ක්ද හා අවශෝෂක පංකා (Exhaust Fan) 6 ක් වෙනුවෙන් රු.100,734 ක්ද වශයෙන් එකතුව රු.825,534 ක් ගෙවා තිබුණමුත් අපේක්ෂිත ආකාරයට ඇතුළත වායු සමනය පවතින බව නිරීක්ෂණය නොවීය. | මෙම කාර්යාලය සැලසුම් කිරීමේ දී තාක්ෂණික නිලධාරියා වෙත අපට අවශ්‍ය සැලසුම සකස් කර දී ඇත. එහි අපගේ දැනුම අනුව වායු සමීකරණ දෙකක් කාමර දෙකකට පෙන්වා ඇත්තේ දළ සැලැස්මක් ලෙසිනි. එහි එම වායු සමීකරණවල තාක්ෂණික කරුණු සඳහන් කර නොමැත. එම සටහනට අනුව තාක්ෂණික නිලධාරියා පරීක්ෂා කර එම කාමරයේ වර්ගඵලය මත අදාළ වර්ගයේ වායු සමීකරණ 03ක් අවශ්‍ය බව නිර්දේශ කර තිබේ. | වායු සමනය පවතින ආකාරයට නැවත සකස් කරවා ගත යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගුවන් මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දින රු. 8,868,900 ක් ගෙවා දේශීය නියෝජිත ආයතනය වන සීමාසහිත භූමි ටෙක් (පෞද්ගලික) සමාගමෙන් මිලදී ගෙන තිබුණු මිනිසුන් රහිත ගුවන් යානයක් (Unmanned Aerial Vehicle) 2017 අගෝස්තු 03 දින හබරණ ප්‍රදේශයේදී යාන්ත්‍රික දෝෂයක් මත අනතුරට ලක් වීම හේතුවෙන් නියෝජිත ආයතනය මගින් අලුත්වැඩියා කර, 2019 මාර්තු 26 දින නැවත දෙපාර්තමේන්තු වෙත භාරදී තිබුණු නමුත්, 2022 අප්‍රේල් මස අවසානය දක්වාද මැනුම් කටයුතු සඳහා මෙම යානය භාවිතයට ගෙන නොතිබුණි. | අදාළ අනතුර සිදුවීමෙන් පසු උපකරණය සීමාසහිත භූමිටෙක් ආයතනය වෙත යවා තිබූ අතර එහි නිෂ්පාදිත රට සමග සම්බන්ධ වී අලුත්වැඩියාව සිදුකිරීමට මාස 18 ක් ගතවී ඇත. නියෝජිත ආයතනය මෙම යානය කඩාවැටීමට හේතුව තාක්ෂණික දෝෂයක් බවට පිළිගැනීම සඳහා යම් කාලයක් ගතවී ඇත. එම අනතුර වගකීම් කාලය තුළ සිදුවී ඇති බැවින් ඒ සඳහා වගකීම භාරගන්නා ලදී. ඒ අනුව අදාළ අලුත්වැඩියාව සිදුකර දුන් නමුත් වෙනත් විවිධ තාක්ෂණික දෝෂ මත මෙය භාවිතයට ගැනීම ප්‍රමාද විය. | යානය භාවිතයට ගත යුතුය. |
| (ආ) | අලුත්වැඩියාවෙන් පසු 2019 අප්‍රේල් 18 දින එම යානය සමග ලැබී තිබුණු විදුලි කෝෂය අක්‍රියවීම හේතුවෙන් උපකරණය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර, 2019 ජූලි 17 දින වන විට හයිපර් එස්. ආර්. (Hipper SR) ටොප් කොන් (Top con) වර්ගයේ ජී.එස්.පී.(GSP) උපකරණය ක්‍රියා විරහිතව පවතින බවද, 2021 මාර්තු 04 දින වන විට යානය සඳහා ලබාදී තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර තිරයේ දෝෂයක් පවතින බවද වාර්තා වුවද, මිනින්දෝරු දෙපාර්තමේන්තුව නියෝජිත ආයතනය සමග මෙම යන්ත්‍රයෙහි අලුත්වැඩියා, සේවා හා නඩත්තු ගිවිසුමකට එළඹ නොතිබුණි. | 2019 අප්‍රේල් මස වන විට යානය සඳහා මිලදී ගෙන ඉතිරිව තිබූ වියළි කෝෂ ඉදිමී තිබීම නිසා යානය ගුවන් ගත කිරීමට නොහැකි විය. 2019 ජූලි මස 17 වන විට Hipper SR Top con වර්ගයේ GPS උපකරණ කොටස (RTK තාක්ෂණය මගින් GPS ඛණ්ඩාංක නිවැරදි කිරීමට අවශ්‍ය වන) ක්‍රියාවිරහිතව පැවති අතර එම උපකරණ කොටස ගුවන්ගත කිරීමට පෙර වියළි කෝෂ ආරෝපණය කළ යුතුය. නමුත් එහි අන්තර්ගතව ඇති (Inbuilt) වියළි කෝෂය ( මෙය මෙම උපකරණයට අනුකූලව සකසන ලද්දක් වන අතර සාමාන්‍ය වෙළඳපොළෙහි ක්ෂණිකව මිලදී ගත හැකි උපාංගයක් නොවේ.) ආරෝපණය නොවූ බැවින් යානය ගුවන් ගත කිරීමෙන් පසු නිවැරදිව GPS ඛණ්ඩාංක ලබා ගැනීමට ඇති අවස්ථාව මගහැරී ගිය නමුත්, යානයෙන් ඡායා රූප ලබා ගැනීමට ඇති හැකියාවට බාධාවක් නොවීය. ඒ සම්බන්ධයෙන් භූමිටෙක් ආයතනයෙන් විමසා ඇත. මෙම යානය සමග ලබා දී තිබූ ලැප්ටොප් | නිසියාකාර නඩත්තුවක් අපේක්ෂා කළ හැකි උපාංග සහිත සේවා ගිවිසුමක් සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පරිගණකයේ තිරය මත වරින්වර දිස්වන ඉරි යෑමේ දෝෂය තවමත් පවතින නමුත් එය යානය ගුවන්ගත කිරීමට බාධාවක් නොවේ. මේ සම්බන්ධව දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය ද දැනුවත් කර ඇත. 2020 නොවැම්බර් 17 දින භූමිටෙක් ආයතනය විසින් වර්ෂ 2021, 2022, 2023 සඳහා උපාංග රහිතව සේවා ගිවිසුමකට මිල ගණන් ලබා දී තිබුණද උපාංග රහිතව සේවා ගිවිසුමක් මගින් නිසියාකාර නඩත්තුවක් අපේක්ෂා කළ නොහැකි බැවින් සේවා ගිවිසුම්ගත කිරීමක් සිදු කර නොමැත. එසේම මෙම උපකරණ රක්ෂණය කිරීමට උත්සාහ කළ ද එය සාර්ථක නොවීය. | |

**3.5 පාඩු හා හානි**

---------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01 සිට 30 කට වැඩි කාල පරාසයක් තුළ අවස්ථා 49 කදී වාහන, මැනුම් උපකරණ හා ගොඩනැගිලි යන වත්කම්වලට සිදුවී ඇති රු.මිලියන 6.8 ක අලාභහානි සම්බන්ධව මු.රෙ. 108 අනුව පරීක්ෂණ සිදු කර මු.රෙ. 109 පරිදි පොතෙන් අස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. මෙම පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට අපහසු බැවින් ඉදිරියේදී පවතින තත්ත්වයන් තුළ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අලාභහානි සම්බන්ධව මු.රෙ. 108 අනුව පරීක්ෂණ සිදු කර මු.රෙ. 109 පරිදි පොතෙන් අස්කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ දී සිදු වූ වාහන අනතුරු 09 ක අලාභවල එකතුව රු.1,053,475 ක්ද, 1998 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සිදු වී ඇති වාහන අනතුරු 13 කට අදාළව එකතු අලාභය රු.4,570,757 ක්ද, හා 1989 සිට 2020 වර්ෂය දක්වා මැනුම් උපකරණ හා වෙනත් හානිවීම් සම්බන්ධ සිද්ධීන් 26 කට අදාළව එකතු අලාභය රු.2,390,893 ක්ද වශයෙන් එකතුව රු.8,015,125 ක කපා නොහළ හා අයකරගත යුතු ලෙස ඉදිරියට ගෙන යන ශේෂ පැවතියද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හානිපාඩු ලේඛනයෙහි ඇතුළත් වී ඇත්තේ රු. 490,341 ක් පමණි. එහි වසර තුනත් නමයත් අතර රු.338,310 ක් වන අතර වසර දහයට වැඩි රු.152,031 ක් වේ. මේ වන විට වසර දහයට අඩු හානිවලින් රු. 57,000 ක් අවසන් වීද, වසර දහයට වැඩි හානිවලින් රු. 92,623 ක් අයවීද ඇත. හානිපාඩු ලේඛණයෙහි ඇතුළත් කිරීම සඳහා තොරතුරු ලබා නොදුන් හානි පිළිබඳව ගොඩනැගිලි අංශයේ ජ්‍යෙෂ්ඨ | මූල්‍ය ප්‍රකාශනවල සටහන්හි ආරම්භක ශේෂයන් ලෙස එතෙක් නොවිසඳී ඇති කරුණු සඳහන් කරමින් අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

නියෝජ්‍ය සර්වේයර් ජනරාල් දැනුවත් කර ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මූල්‍ය ප්‍රකාශනවල සටහන් ii -1 හා ii-2 හි තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ වර්ෂය තුළ දී සිදු වූ සිදුවීම් වන බැවින් හා පසුගිය වර්ෂවලට අදාළව මේ වර්ෂයේ දී නිරවුල් නොවූ ඉදිරියට පවතින ශේෂ හෙළිදරව් කිරීම සඳහා ආකෘතිය තුළ ස්ථානයක් හඳුන්වා නොදීම නිසා එම හෙළිදරව් කිරීම සිදු කර නොමැති නමුත් අප විසින් පවත්වා ගෙන යනු ලබන හානිපාඩු ලේඛනයේ ඒවා විධිමත්ව සටහන් කර ඇත.

(ඇ) වටිනාකම රු.8,015,125 ක් වූ මෙම කපා නොහළ ඉදිරියට ගෙන ආ ශේෂය තුළ වසර තුනත් නවයත් අතර පරාසයක වූ රු. 3,473,623 ක්ද, වසර දහයත් තිහත් අතර පරාසයක වූ රු.3,488,027ක් විය. ඒ පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේදී මෙම ප්‍රමාදයට පහත සඳහන් කරුණු හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(i) බදුල්ල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අයත් අංක 61 - 6600 දරන වාහනය 2015 ජූනි 11 දින කොළඹ බලා පැමිණීමේදී රත්නපුර ප්‍රදේශයේදී අනතුරට පත්වීමට අදාළව 2015 ඔක්තෝබර් 06 දිනැති මු.රෙ.104(4) අවසන් වාර්තාව අනුව රු. 1,052,825 ක් වූ මුළු අලාභය අදාළ නිලධාරීන්ගෙන් අය කිරීමට නිර්දේශ කර තිබුණු නමුත්, මැනුම්පතිගේ ඉල්ලීම පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත නැවත පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ 2021 ඔක්තෝබර් 12 දිනැති වාර්තාව අනුව වාහනයේ අලුත්වැඩියා වියදම වූ රු.540,000 න් සියයට 50 ක් වන රු.270,000 ක් පමණක් රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණි. ගරාජයට වූ රු. 243,450 ක

අංක 61-6600 දරන වෑන් රථය 2015 ජූනි 11 දින අනතුරට පත්වීමට අදාළව පළමුව පත්කළ මු.රෙ.104 (4) මණ්ඩලය විසින් ඉදිරිපත් කළ මු.රෙ.104(4) වාර්තාවේ, අනතුරට වගකිව යුතු ලෙස සඳහන් කර ඇති නිලධාරීන් සෘජුවම එම අනතුරට වගකිව යුතුද යන්න තහවුරු වන බවක් නොපෙනෙන බැවින්, නැවත කමිටුවක් පත් කරන ලෙස හිටපු සර්වේයර් ජනරාල් විසින් නියෝග කර ඇත. ඒ අනුව නැවත මු.රෙ.104(4) මණ්ඩලය පත්කිරීමට අනුමැතිය සඳහා 2016 ජූනි 02 දින අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර අදාළ මු.රෙ.104(4) මණ්ඩලය 2020 දෙසැම්බර් 11

රියදුරුගෙන් අදාළ අය කර ගැනීම් කිරීමට හා ගරාජයට වූ රු. 243,450 ක අලාභය ඉල්ලා පැල්මඩුල්ල දිසා අධිකරණයේ දෙපාර්තමේන්තුවට එරෙහිව පවතින නඩුව කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | අලාභය ඉල්ලා පැල්මඩුල්ල දිසා අධිකරණයේ දෙපාර්තමේන්තුවට එරෙහිව නඩුවක් විභාග වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | දින අනුමත කර එවා තිබුණි. ඒ අනුව නැවත ඉදිරිපත් කළ මු.රෙ.104(4) වාර්තාවේ වාහනයේ අලුත්වැඩියා වියදම වූ රු.540,000 න් සියයට 50 ක් රියදුරුගෙන් අය කර ගැනීමට නිර්දේශ කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ද ලැබී ඇත. එම තීරණය අනුව අලාභයේ ඉතිරි සියයට 50 ඉදිරියේදී දෙපාර්තමේන්තු පොත්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරමි. මේ සඳහා විභාග වන නඩුවේ පූර්ව විභාගය අවසන් වී නඩුව විභාග වෙමින් පවතින බවද කාරුණිකව දන්වා සිටිමි. | |
| (ii) | මධ්‍යම පළාතේ දිගන ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත අංක 54 - 2286 දරන කැබ්රථය 2020 පෙබරවාරි 11 දින මැනුම් කටයුතු සඳහා මීමුරේ ප්‍රදේශයට ගිය අවස්ථාවේදි රියදුරු විසින් බීමත්ව රිය පදවා ඇති බැවින් ප්‍රපාතයකට පෙරළී අනතුර සිදුවී ඇත. මෙහි මුළු අලාභය රු.650,800 ක් වී තිබුණි. මු.රෙ.104(1) (ආ) අනුව රු.500,000 හා ඊට වැඩි තක්සේරු කරන ලද පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියා විසින් 104(4) අවසන් පරීක්ෂණ මණ්ඩලය පත්කළයුතු වුවද එසේ සිදු කර නොතිබුණු අතර, මෙතෙක් අලාභය අයකර ගෙන නොතිබුණි. | අංක 54-2286 දරන වාහනය අනතුරට අදාළව මු.රෙ 104(3) වාර්තාව සමග ඉදිරිපත් කර ඇති රු.615,800 ක ඇස්තමේන්තුව දළ ඇස්තමේන්තුවකි. එය රු.500,000 ට වැඩි බැවින් මු.රෙ. 104(4) මණ්ඩලය පත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාවට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය 2022 ජුනි 15 දින ලැබී ඇති අතර, අලුත්වැඩියාව සඳහා දරා ඇති සම්පූර්ණ මුදල හා ඇදගෙනයාමට වැයකළ රු.35,000 ක මුදල ඉදිරියේදී රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමට උපදෙස් දී ඇත. | අදාළ අලාභය අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (iii) | අංක NWNB - 2339 දරන පුද්ගලික බස්රථයේ මුහුණට මුහුණ ගැටී වයඹ පළාත් කාර්යාලයේ අංක 250-4741 දරන කැබ්රථයට ගල්ගමුවේදී අලාභහානි සිදුවී තිබුණි. බස්රථ රියදුරුගෙන් හෝ ඔහුගේ රක්ෂණ නියෝජිතායතනයෙන් අලාභය | අංක 250-4741 දරන කැබ රථය 2016 මැයි 19 දින අනතුරට පත්වීමට අදාළ නඩුවේ චෝදනා පත්‍රය නීති කටයුතු සඳහා 2022 අප්‍රේල් 22 දින නීති අංශය වෙත යොමු | අදාළ අලාභය අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අයකර ගැනීමට මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ මණ්ඩලය 2018 පෙබරවාරි 02 දින නිර්දේශ කර තිබුණු නමුත්, රු. 820,850 ක් වැයකර රජයේ මුදලින් අලුත්වැඩියා කර තිබුණි. බස් රථයේ රියදුරුට විරුද්ධව නඩු පැවරීම සඳහා චෝදනා පත්‍රයේ පිටපතක් ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (පාලන) වෙත එවන මෙන් වයඹ පළාත් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත දැනුම් දී ඇතත් 2022 අප්‍රේල් අවසන් වන විටත් එවා නොතිබුණු අතර, බස් රථයේ අංකයද සාවද්‍ය ලෙස පොලිස් වාර්තාවේ සඳහන් කර තිබුණි. අනතුර සිදුවී වසර 6 ක් ඉක්මවා ඇතත් අදාළ අලාභය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. | කර අදාළ ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | |

(ඇ) 2021 වර්ෂයේදී සිදුවී ඇති වාහන අනතුරු පිළිබඳව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (i) දියතලාව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2021 ජනවාරි 06 දින අංක PE - 4187 දරන වාහනය පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා ධාවනය කරන අතරතුරදී වින්ඩ්ස්ක්‍රීන් එක බිඳී ඇති අතර අලාභය රු.139,917 ක් විය. අදාළ නිලධාරියා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අලාභය අදාළ නිලධාරියාගෙන් හෝ රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | අංක PE-4187 රථය 2021 අප්‍රේල් 06 දින අනතුරට පත්වීමට අදාළව නැවත රක්ෂණ ගොනුව ආරම්භ කර ඇති අතර, අලුත්වැඩියාව සඳහා වැය වූ මුදල ටොයෝටා ආයතනය වෙත ගෙවන බව ද දන්වා ඇත. එසේ ගෙවූ මුදල පිළිබඳව දුරකථනයෙන් හා ලිඛිතව විමසා ඇති අතර, එම තොරතුරු කඩිනමින් ලබාගෙන අදාළ ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | නිලධාරියා සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ හා අදාළ ක්‍රියාමාර්ග ගැනීමටද අලාභය අදාළ නිලධාරියාගෙන් අය කර ගැනීමට හෝ රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමටද කටයුතු කළ යුතුය. |
| (ii) මධ්‍යම පළාතේ දොළුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අයත් අංක 51 - 0364 වාහනය අංක PB- 4705 දරන පුද්ගලික වෑන් රථයේ මුහුණට මුහුණ ගැටීම නිසා මහනුවරදී අනතුරක් සිදු වී ඇති නමුත් මු.රෙ.103 (1) (ආ) අනුව පොලිසියට පැමිණිලි කර නොතිබුණි. වෑන් රථයේ හිමිකරු විසින් කැබ් රථයට සිදුවූ | අංක 51-0364 වාහනය අනතුරෙන් පසු අලුත්වැඩියාව සිදුකර නැවත ධාවනයට එක් කර ඇත. මෙම හානි සම්බන්ධව මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාව අවසන් අදියරේ පවතී. ඒ සඳහා අනුමැතිය ලබා දුන් පසු අදාළ බලධාරියාගේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා | හානි සම්බන්ධව මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව හා අදාළ බලධාරීන්ගේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.57,000 ක අලාභය මුදලින් ගෙවීමට එකඟවීම නිසා වෑන් රථයේ හිමිකරුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොකරන බවට මධ්‍යම පළාත් සර්වේයර් ජනරාල් විසින් එකඟ වී අලුත්වැඩියාව සඳහා කෑගල්ල ප්‍රදේශයේ පුද්ගලික ගරාජයක් වෙත සෘජුවම මුදල් ලබාදී මාස 06 ක් ගතවී තිබුණද, අලුත්වැඩියාව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මු.රෙ. 104(4) අවසන් පරීක්ෂණය සිදු කිරීමට 2021 ඔක්තෝබර් 26 දින කමිටුවක් පත් කර මාස 06 ක කාලයක් ඉක්මවා ගොස් තිබුණද, අදාළ පරීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. | කටයුතු යොදා ඇත. | |
| (iii) | 2021 ඔක්තෝබර් 15 දින මැනුම් කටයුතු සඳහා බදුල්ල ප්‍රදේශයට ගිය අවස්ථාවේදී ප්‍රධාන කාර්යාලයේ භූමිතික අංශයේ අංක PD -9196 දරන කැබ් රථය පාරේ වම්පස නතර කර තිබියදී අංක UPLE - 7355 දරන පුද්ගලික කන්ටේනර් රථය ගැටී අනතුරක් සිදු වී ඇති නමුත් පොලිසියේ පැමිණිල්ල දැමීමේදී වාහන අංකය පමණක් සඳහන් කර තිබුණු අතර, එම රථයේ රියදුරුගේ කිසිදු තොරතුරක් ලබාගෙන නොතිබුණි. 2021 නොවැම්බර් 02 දින වාහනයේ නියෝජිතායතනය වන ටොයෝටා සමාගම විසින් රු.203,930ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු නමුත් මේ දක්වා අලුත්වැඩියාව සිදු කර හෝ රක්ෂණ සමාගමෙන් අලාභය ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | අංක PD-9196 දරණ කැබ් රථයේ අලුත්වැඩියාව අවශ්‍ය අමතර කොටස් නොමැතිවීම හේතුවෙන් මේ වන තෙක් සම්පූර්ණයෙන් නිම කර නොමැත. ඒ අනුව ඉදිරියේදී අදාළ අලුත්වැඩියාව සිදු කිරීමෙන් අනතුරුව දැරීමට සිදුවන පිරිවැය අනුව අවසන් අලාභය නිවැරදිව ඇතුළත් කර හානි පරීක්ෂණය නැවත සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අලුත්වැඩියාව සිදු කර අදාළ රක්ෂණ සමාගමෙන් අලාභය ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ වර්ෂය අවසානය වන විට රු. 8,723,923 ක හිඟහිටි ණය ශේෂ වූ අතර, ඒ තුළ වර්ෂ 5 ඉක්මවූ එකතුව රු. 3,661,070 ක ශේෂයන් විය. | නිරීක්ෂණ නිවැරදිය. මේ වන විට ඉන් රු. 1,175,168 ක ණය ශේෂ නිරවුල් කර ඇති අතර එහි වර්ෂ පහකට වැඩි ශේෂ රු. 19,801 ක් වේ. මීට අමතරව මු.රෙ 113 යටතේ පොතෙන් අත්හැර දැමීම අනුමත වූ වර්ෂ පහට වැඩි ණය ශේෂ රු. 72,685 කි. ඒ අනුව තවදුරටත් නිරවුල් කිරීමට ඇති ණය ශේෂය රු.7,476,070 කි. ඉන් රු.183,860 කට අදාළ ණය ශේෂ වාරික වශයෙන් අය වෙමින් පවතී. | හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්යය මණ්ඩලයට සාපේක්ෂව ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියයට 23 ක්, තෘතීයික මට්ටමේ සියයට 14 ක්, ද්විතීයික මට්ටමේ සියයට 10 ක් හා ප්‍රාථමික මට්ටමේ සියයට 27ක් වශයෙන් සමස්ත කාර්යය මණ්ඩල පුරප්පාඩු සියයට 24 ක් විය. | සෑම වර්ෂයකදීම ඉලක්ක සකස් කරනු ලබන්නේ අනුමත කාර්යය මණ්ඩලය පදනම් කරගෙන නොව වර්ෂය මුලදී සේවයේ නියුතු තථ්‍ය කාර්යය මණ්ඩලය පදනම් කරගෙන බව කාරුණිකව පෙන්වා දෙමි. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වේ. |